ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

චක්‍රලේඛ අංකය :**SP/DSP/DPU/19/17**

මගේ අංකය :PS/DSP/DPU/01/02/02

2017 දෙසැම්බර් මස [illegible] දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පොලිස්පති - ශ්‍රී ලංකා පොලීසිය,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>ප්‍රජා පොලිස් කමිටුව, ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව ලෙස බලගැන්වීම</u>**

**01. <u>හැඳින්වීම</u>**

ප්‍රජාව පාදක කර ගනිමින් පොලිස් රාජකාරි වඩාත් ඵලදායීව ඉටු කිරීම හා පොලීසිය හා ප්‍රාදේශීයව පවතින අනෙකුත් රාජ්‍ය ආයතන අතර අන්තර් සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම හා නිසි මග පෙන්වීම තුළින් ජනතාවට සමීප සුහදශීලී පොලිස් සේවයක් සැපයීම මඟින්, ශ්‍රී ලංකාව තුළ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම, නීතිය බලාත්මක කිරීම, සාමය ආරක්ෂා කිරීම හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය සැපයීම මෙන්ම සමස්ත අනතුරු අවම කිරීම අරමුණු කර ගනිමින් **"ප්‍රජා පොලිස් සංකල්පය"** හඳුන්වා දී ඇත. ග්‍රාමීය ගැටලු නිරාකරණය කර ගැනීමේ දී රාජ්‍ය නිලධාරීන්, ශ්‍රී ලංකා පොලීසිය හා ග්‍රාමීය ජනතාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම ද මින් අපේක්ෂා කෙරේ.

එමෙන්ම ගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකාය මගින් රට තුල සමස්ත ප්‍රජාවටම ව්‍යසනයක්ව පවතින මත්ද්‍රව්‍ය උවදුර (දුම්වැටි, මද්‍යසාර, මත්ද්‍රව්‍ය හා වෙනත් අන්තරායකර ඖෂධ වර්ග) සම්බන්ධයෙන් (i) **ප්‍රතිපත්ති හා නීති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම,** (ii) **ප්‍රතිකාර හා පුනරුත්ථාපනය** සහ (iii) **නිවාරණය** යන කරුණු තුන ඔස්සේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ මත්ද්‍රව්‍ය නිවාරණ ජනාධිපති කාර්යය සාධන බලකායේ මෙහෙයවීමෙන් ප්‍රජා පොලිස් කමිටුව හරහා ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු සිදු කිරීම ද අපේක්ෂා කෙරේ.

**02. <u>ප්‍රජා පොලිස් කමිටුව හා එහි ක්‍රියාකාරීත්වය</u>**

මේ සම්බන්ධයෙන් උපදෙස් ඇතුළත් කරමින් 2017 ජූලි මස ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද **"HAF/Add.Sec/01/මත්ද්‍රව්‍ය"** දරන චක්‍රලේඛය අනුව **ප්‍රජා පොලිස් කමිටුව, ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුව ලෙස ද ක්‍රියාත්මක විය යුතුය.** (අදාළ චක්‍රලේඛය පරිශීලනය කරන්න)

2.1 ග්‍රාමීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටුවේ සභාපති ලෙස වසම භාර ග්‍රාම නිලධාරී පත් කළ යුතු බව එම චක්‍රලේඛයේ අංක 15 හි ii යටතේ දක්වා ඇති අතර එය "**ප්‍රජා පොලිස් කමිටුවේ ලේකම් නිලබලයෙන් වසම භාර ග්‍රාම නිලධාරී** විය යුතුය" යනාදී ලෙස සංශෝධනය විය යුතුය. ඊට අමතරව සම ලේකම් කෙනෙකු ද පත්කර ගත හැකිය.

2.2 සිවිල් සංවිධානයක් ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව සුභසාධක කාර්යයන්හි නිරත වීමේ අවස්ථාව ප්‍රජා පොලිස් කමිටු වෙත ලබා දී ඇත.